www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ගුරු වර්ජනය පාවා දෙයි

## Sri Lankan trade unions betray teachers strike

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2007 නොවැම්බර් 3**

ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තීය සමිති පහක සන්ධානයක් මේ සතියේ සඳුදාට හා අඟහරුවාදාට නියමිතව තිබූ රජයේ පාසල් ගුරුවරුන්ගේ දෙදින වර්ජනයක් අවසාන මොහොතේ අවලංගු කලේ ය. සමිති තුනක් මේ වසර අග වන විට වැටුප් ආරවුල විසඳන බවට ආන්ඩුව දුන් පලක් නැති පොරොන්දුව විවෘතව පිලිගත්තේ ය. අනෙක් සමිති දෙක තමන්ට උද්ඝෝෂනය ඉදිරියට ගෙන යාම කල නොහැකි බව ප්‍රකාශ කරමින් ඉක්මනින් ම එම පිලිවෙතට යටත් විය.

ආන්ඩුවේ තර්ජන හා බියගැන්වීම් නොතකා ලක්ෂ සංඛ්‍යාත ගුරුවරු වර්ජනයට එක් වීමට සූදානමින් සිටියහ. දිගු කලක් තිස්සේ පවතින වැටුප් විෂමතා නිවැරදි කරන ලෙස ඉල්ලමින් සැප්තැම්බර් 13 දා පැවති එක් දින වර්ජනයකට දිවයින පුරා ගුරුවරු 200,000ක් පමන සහභාගි වූයේ යැයි තක්සේරු කෙරුනි. මේ සතියේ දී ගුරුවරු කෝපයෙන් යුක්තව *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* කියා සිටියේ වර්ජනය අවලංගු කිරීමේ තීන්දුව සමිති නායකයන් විසින් සිදු කරන ලද විවෘත පාවාදීමක් බවයි.

සෙසු කම්කරුවන් සම්බන්ධයෙන් මෙන් ම, ගුරුවරුන්ගේ වැටුප් ද මූලික භාන්ඩවල මිල ගනන් තියුනු ලෙස ඉහල යාම මගින් ඛාදනය වී තිබේ. ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යලි ඇරඹූ යුද්ධයේ කොටසක් ලෙස මිලිටරි වියදම් දැවැන්ත ලෙස ඉහල දැමීම උද්ධමනය ඉහල යාමට ආංශිකව බලපා ඇත.

පසුගිය ඉරිදා උදේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, සමිති පහේ ම නායකයන් අවධාරනය කලේ පරිපූර්න උද්ඝෝෂනයක් ගෙන යාම සිය අධිෂ්ඨානය බව යි. දෙදින වර්ජනයෙන් පසුව වැටුප් විෂමතා ඉවත් කිරීමට ආන්ඩුව ක්‍රියා නොකල හොත් "වඩා බලගතු ක්‍රියාමාර්ග ගන්නා" බවට ලංකා ගුරු සේවා සංගමයේ (ලගුසේස) සභාපති මහින්ද ජයසිංහ වාචාල ලෙස අනතුරු ඇඟවී ය. ඔහුගේ සමිති නිලධර සගයන් සියල්ලෝ ම ඊට සමාන පූර්වානම් බස් දෙඩූහ.

එදින ම සවස් වරුවේ එම නායකයෝ ම වර්ජනය වලක්වා ගැනීමේ එල්ලයෙන් යුතු අවසාන මොහොතේ සාකච්ඡා සඳහා අධ්‍යාපන ඇමති සුසිල් ප්‍රේමජයන්තගේ කාර්යාලයට ගාල් වූහ. සමිති තුනක් -- ලගුසේස, අධ්‍යාපන වෘත්තිකයන්ගේ සංගමය (අවෘස) සහ සමස්ත ලංකා ගුරු සංගමය (සලගුස) -- රැස්වීමෙන් පිටවූයේ ජයග්‍රාහී ලීලාවෙනි. කඩිමුඩියේ ප්‍රවෘත්ති සාකච්ඡාවක් කැඳවූ සමිති නායකයෝ, "පවත්නා තත්වයී සැලකිල්ලට ගැනීමෙන් පසුව තමන් ආන්ඩුවේ පොරොන්දුව පිලිගත් බව පැහැදිලි කලහ.

මෙම "පොරොන්දුවී කොහෙත්ම අලුත් එකක් නොවේ. අධ්‍යාපන ඇමති ඔක්තෝබර් 25 දා ම නිවේදනය කර තිබුනේ, වැටුප් හා පිරිස් බල කොමිෂම ලවා වැටුප් ප්‍රශ්නය පරීක්ෂාවට ලක් කොට එහි වාර්තාව අනුව දෙසැම්බර් 31 දා වන විට ක්‍රියාත්මක වන බව යි. ආන්ඩුවේ කොමිෂන් නම් වූ කෙලවරක් නැති වංකගිරි තුලට ආරවුල් අපසරනය කිරීම අතීතයේ දී ආන්ඩු විසින් යොදා ගනු ලැබ ඇති සම්මත උපායකි. ඉරිදා සවස් වරුව වන තෙක් ම සමිති පහම ඇමතිගේ එම යෝජනාව ප්‍රතික්ෂේප කර තිබුනි.

ගුරුවරු අතර පවත්නා වෛරය දැන හොඳින් දැනුවත්ව, ලංකා ගුරු සංගමය (ලගුස) සහ ලංකා ගෘහ විද්‍යා හා කෘෂිකර්ම ඩිප්ලෝමා ගුරු සංගමය (ලගෘකෘඩිගුස), වහාම යටත් වීමට මැලි විය. තමන් පොරොන්දුව පිලිගැනීම ප්‍රතික්ෂේප කල බව එම සමිතිවල නායකයෝ ප්‍රවෘත්ති මාධ්‍යවලට පැවසූහ. එහෙත් යථාර්ථය වූයේ එම සමිති දෙක ද වර්ජනය නතර කිරීමේ තීන්දුව සමග නිහඬව එකඟ වීම යි. සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකයකු අභියෝග කල විට, ලගුස සභාපති ජෝශප් ස්ටාලින් ප්‍රකාශ කලේ, තම සමිති දෙකට "තනියම යා නොහැකි" බව යි.

සමිතිවල යටත් වීමට පිටුපසින් පවතින්නේ, ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට විරුද්ධ වීම ඔවුන් ප්‍රතික්ෂේප කිරීම යි. ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අනුබද්ධිත ලගුසේස සම්බන්ධයෙන් ගත් කල, හේතුව පැහැදිලි ය. විවෘතව ම සිංහල ස්වෝත්තමවාදී පක්ෂයක් වන ජවිපෙ, පාර්ලිමේන්තුව තුල ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවට සහයෝගය දෙයි. රාජපක්ෂ සම්බන්ධයෙන් ඔවුන්ට පවතින එක ම විවේචනය වන්නේ, ඔහු ඇති තරම් රුදුරු ලෙස යුද්ධය ගෙන යාමට අපොහොසත්ව ඇති බව යි. "පවත්නා තත්වය

“ පිලිබඳව එය කරන සැඳහුමේ අර්ථය වන්නේ, යුද්ධය වෙනුවෙන් සෑම දෙයක් ම කැප කල යුතු බවට ආන්ඩුව කරන ඉල්ලීමට දෙන පූර්න සහයෝගය යි.

ආන්ඩුවට මුදල් නැති බව ප්‍රකාශ කරමින්, ජනාධිපති රාජපක්ෂ, ගුරුවරු හා සෙසු කම්කරු කන්ඩායම් වැඩි වැටුප් සඳහා කර ඇති ඉල්ලීම් කෙලින් ම ප්‍රතික්ෂේප කර තිබේ. පසුගිය සතියේ දී, අධ්‍යාපන ඇමති ප්‍රේමජයන්ත සැලසුම් කෙරී තිබූ වර්ජනය දේශද්‍රෝහී ක්‍රියාවක් ලෙස තථ්‍ය වසයෙන් ම හංවඩු ගැසී ය. “උතුරේ හා නැගෙනහිර සිය ජීවිත පරිත්‍යාග කරමින් රට ආරක්ෂා කර ගැනීමේ කර්තව්‍යයක ආරක්ෂක හමුදාවන් යෙදී සිටින විට, ඔවුන්ගේ ධෛර්යයට බලපාන වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල නොයෙදීමට” ගුරුවරු වගබලා ගත යුතු යැයි ඔහු කියා සිටියේ ය.

මෙම හෙලාදැකීම්වලට පොලිස් මර්දන සූදානමේ පිටුබලය ද ලැබුනි. විරෝධතා සඳහා යන සූදානම පිලිබඳ තොරතුරු රැස් කරන ලෙස පොලිස්පති වික්ටර් පෙරේරා පොලිස් ස්ථානවලට අන කලේ ය. වර්ජනය කරන ගුරුවරු පිලිබඳ තොරතුරු රැස් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යංශයට අන කරන ලදි. අඩු ගනනේ එක පලාතක, පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමග සම්බන්ධිත මැරයෝ පාසලකට ඇතුලු වී වර්ජනයට එක් වන අයට තර්ජනය කලහ. එකඳු ගුරු සමිතියක් වත් මෙම පියවරවලට එරෙහිව විරෝධතාවක් වත් පල නොකලේ ය.

අවෘස සහ සලගුස, ලංකා ගුරු සේවා සංගමයට විවෘතව ම පිටුබලය සපයා ඇති අතර ලගුස සහ ලගෘකෘඩිගුස ජවිපෙ යුද-ගැති ආස්ථානයෙන් දුරස්ථ වීමට උත්සාහ දරා ඇත. ලගුස නායකයෝ, මහ බලවතුන්ගේ අනුග්‍රහය ලබන ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයට සහයෝගය දීම මගින්, යුද්ධයට “විරුද්ධ” වන නව සමසමාජ පක්ෂයේ (නසසප) සහ එක්සත් සමාජවාදී පක්ෂයේ (එසප) මධ්‍යම පන්තික රැඩිකලුන් දෙසට විශේෂයෙන් ම ආකර්ෂනය වී සිටී.

මහ ව්‍යාපාරික කොටස්වල පිටුබලය ලබන මෙම සාම ක්‍රියාදාමයේ එල්ලය වී ඇත්තේ දිවයින ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස විවෘත කර ගනු වස් එල්ටීටීඊය සමග බලය බෙදා ගැනීමේ සැකැස්මක් ඇති කර ගැනීම යි. එය පාලක කවයන්ට හෝ කම්කරු පන්තිය භේද කරනු වස් දශක ගනනාවක් තිස්සේ ඔවුන් යෙදා ගෙන ඇති වාර්ගික දේශපාලනයට හෝ කිසිදු අයුරකින් අභියෝග නොකරයි. එවන් සාම සාකච්ඡා පිලිබඳ මිථ්‍යාවන් තොරොම්බල් කිරීම මගින්, නසසප හා එසප කරන්නේ කම්කරුවන් දේශපාලන සංස්ථාපිතයේ ඒ හෝ මේ කන්ඩායමට ගැට ගැසීම යි.

එබැවින්, ලගුස සැප්තැම්බරයේ දී දක්ෂිනාංශික විපාර්ශ්වය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග වෘත්තීය සමිතිවල හා නසසපයේ “පුලුල් පෙරමුනක්” කැඳවීම පුදුමයට කාරනාවක් නොවේ. 1983 දී සිවිල් යුද්ධය දියත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු එජාපය, 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුම අත්සන් කොට, සාම ක්‍රියාදාමයට පිටුබලය දී එල්ටීටීඊය සමග සාකච්ඡා පැවැත්වී ය. කෙසේ වෙතත්, පසුගිය මාස 18 තිස්සේ යුද්ධය උත්සන්න වීමත් සමග ම. එජාපය අනවරතයෙන් ආන්ඩුවේ යුද ප්‍රචාරක ව්‍යාපාරයට අනුගත වී ඊනියා සාම ක්‍රියාදාමයෙන් දුරස්ථ වී තිබේ.

ලගුස නායකයෝ ද ඊට සමාන ගමන් පථයක් අනුගමනය කොට ඇත. පෙබරවාරියේ දී, ජවිපෙ, “සාම ක්‍රියාදාමයට” සහයෝගය දෙන ලගුස සභාපති ඇතුලු වෘත්තීය සමිති නායකයන් ගනනාවක් ම “සිංහල කොටි” ලෙස, එනම් ද්‍රෝහීන් ලෙස, හංවඩු ගැසී ය. එහෙත් වත්මන් වැටුප් උද්ඝෝෂනය තුල දී, ලගුස, ජවිපෙට අනුබද්ධිත ලංකා ගුරු සේවා සංගමයට අභියෝග කිරීම ප්‍රතික්ෂේප කොට වැටුප් හා ජීවන කොන්දේසි මත යුද්ධය ඇති කරන බලපෑම සම්බන්ධයෙන් කිසිදු සාකච්ඡාවක් පැවැත්වීමට විරුද්ධ වී තිබේ.

පසුගිය සතියේ දී ලගුස නායකත්වය සිය සමිතියට අයත් සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකයන් ගුරු සමිති පහේ රැස්වීමකට සහභාගි වීම තහනම් කලේ, සසප “දේශපාලන ප්‍රශ්න” මතු කරනු ඇත යන හේතුව මත ය. යුද්ධය සහ එහි ප්‍රතිවිපාක පිලිබඳව සාකච්ඡා කල නොහැක්කේ මන් ද යනුවෙන් අභියෝග කල විට, ලගුස සභාපති කෙලින්ම ප්‍රකාශ කලේ, “විවිධ අදහස් සහිත විවිධ වෘත්තීය සමිති” එහි ඇති බැවින් එය “නුසුදුසු” බව යි.

දේශපාලන පෙලගැස්ම පැහැදිලි ය: ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට සහයෝගය දෙන ලගුසේස නායකයන්ට නිදහසේ කතා කිරීමට අවසර ඇත. එහෙත්, එකමුතුවේ නාමයෙන්, ලගුසේස හා ජවිපෙ ප්‍රතිගාමී දේශපාලනයට එරෙහි මොන යම් හෝ අභියෝගයක් මතු කිරීම ලගුස නායකත්වය තහනම් කරයි. මෙම අවස්ථාවාදී සන්ධානයේ අවසන් ප්‍රතිඵලය නම්, අත්‍යවශ්‍ය පොදු සේවාවන් සඳහා වෙන් කෙරෙන මුදල් දරුනු ලෙස කප්පාදු කරමින් යුද්ධය සඳහා බිලියන ගනන් දිගට ම වියදම් කිරීමට ආන්ඩුවට ඉඩ දෙමින්, වර්ජනය නතර කර දැමීම යි.

ආන්ඩුව සිය පොරොන්දුව බිඳ දැමුව හොත් තමන් “අරගලයක් සංවිධානය” කරන බවට දැන් ලගුසේස ප්‍රකාශ කරයි. ලගුස, තමන්ගේ ම ක්‍රියාකලාපය ආවරනය කර ගැනීමේ මංමුලා සහගත ප්‍රයත්නය යෙදෙමින්, සෙසු සමිති පාලකයන්ගේ “සුරතලුන්” ලෙස හෙලා දැක “අරගලය අධිෂ්ඨානවත්ව ඉදිරියට ගෙන යන” බව ප්‍රකාශ කර ඇත. මේ සියල්ල ම මුලුමනින්ම හිස් වාචාල ප්‍රකාශ ය. විය යුතු පරිදි ම, වසර අවසානයේ දී වත්මන් වැටුප් විෂමතාව අවසන් කිරීමට ආන්ඩුව අසමත් වූ කල, මෙම සමිති නායකයන් ඔවුන් දැන්

කරන දෙයට වඩා වැඩිමනත්" අධිෂ්ඨානවත් අරගලයක් " නම් නොකරනු ඇත.

ගුරුවරුන් ඉදිරියේ පවත්නා තීරනාත්මක කාරනාව නම්, මැත ම පාවාදීමේ දේශපාලන පාඩම් උකහා ගැනීම යිඃ එනම්. යුද්ධයට එරෙහි උද්ඝෝෂනයකින් තොරව, කම්කරු පන්තියේ කිසිදු කොටසකට සිය රැකියා, සේවා කොන්දේසි හා මූලික අයිතීන් ආරක්ෂා කර ගත නොහැකි ය යන්නයි. යුද්ධය හා සමාජ අසමානතාව අවසන් කිරීමේ අපගේ සමාජවාදී ක්‍රියාමාර්ගය පිලිබඳව බැරෑරුම්ව සිය සැලකිල්ල යොමු කරන ලෙස සියලු ම ගුරුවරුන්ගෙන් සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටී.

කම්කරු පන්තියේ -- දෙමල, සිංහල හා මුස්ලිම් එක සේ -- ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමේ ප්‍රථම පියවර වන්නේ වහාම හා කොන්දේසි විරහිතව උතුරෙන් හා නැගෙනහිරෙන් මිලිටරිය ඉවත් කරන ලෙස ඉල්ලා සිටීම යැයි අපි අවධාරනය කරමු. අතලොස්සකගේ ලාභ අවශ්‍යතා නොව. බහුතරයකගේ අවශ්‍යතා සපුරාලනු පිනිස සමාජය මුලුමනින් ම ප්‍රතිසංවිධානය කරනු වස්, කම්කරු-ගොවි ආන්ඩුවක් -- ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් -- සඳහා සසප සටන් වදී. මෙය දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා වන වඩා පුලුල් අරගලයක කොටසක් විය යුතු ය.

© www.wsws.org